Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

# වලල්ලාවිට ප්‍රාදේශීය සභාව

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ වලල්ලාවිට ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති බස්නාහිර පළාතේ පදිංචි කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු අංකය | තනතුර නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|---|
| 01 | කාර්යාල කාර්ය සහයක III | 01 | PL1-2016<br>රු. 24,250-10x250-10x270<br>10x300-12x330-<br>රු. 36,410 | අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 02ක් සහිතව විෂයයන් හය (06) ක් සමත් වී තිබීම (මින් විෂයයන් 05ක් එකවර සමත්විය යුතුය.) |
| 02 | ඖෂධ සංයෝජක III | 01 | PL2-2016<br>රු. 25,250-10 x270-10 x 300<br>10 x 330-12 x350-<br>රු. 38,450 | අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 02ක් සහිතව විෂයයන් හය (06) ක් සමත් වී තිබීම (මින් විෂයයන් 05ක් එකවර සමත් විය යුතුය)<br><br>පළපුරුද්ද :<br><br>රජයේ ආයුර්වේද බෙහෙත් ශාලාවක හෝ රජය විසින් පිළිගත් ලියාපදිංචි ආයුර්වේද බෙහෙත් ශාලාවක වසරකට නොඅඩු කාලයක ක්ෂේත්‍රයට අදාළ සේවා පළපුරුද්ද ලබා තිබීම. (සහතික මඟින් සනාථ කළ යුතුය.) |
| 03 | පෙර පාසල් ගුරු III | 01 | MN 1-2016<br>රු. 27,140-10 x 300-11 x 350<br>10 x 495-10 x660-<br>රු. 45,540 | *(අ)* සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව/ගණිතය සහ තවත් විෂයන් දෙකකට සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයන් 06කින් අ. පො. ස. සා.පෙළ විභාගය සමත්ව තිබීම.<br>(ආ) අ.පො.ස. උසස් පෙළ විභාගයේදී අවම වශයෙන් එක් විෂයක්වත් සමත් වී තිබීම (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර)<br><br>වෘත්තීය සුදුසුකම් :<br><br>පෙර පාසල් ගුරුවරුන් පුහුණු කිරීමේ රජයේ ආයතනයක් මගින් හෝ රජය පිළිගත් (ලියාපදිංචි කරන ලද) පෙර පාසල් ගුරු පුහුණු ආයතනයක් මගින් ළදරු අධ්‍යාපන හා ළමා සංවර්ධනය පිළිබඳ මාස 06කට නොඅඩු කාලයක පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා තිබිය යුතුය. |
| 04 | සෞඛ්‍ය කම්කරු III | 04 | PL1-2016<br>රු. 24,250-10x250-10x270<br>10x300-12x330-<br>රු. 36,410 | 8 ශ්‍රේණිය (9 වසර) සමත් විය යුතුය. |

02. *කායික සුදුසුකම් .-* තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

03. *අවශ්‍ය අනෙකුත් සුදුසුකම් :*

(i) ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
(ii) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර 03ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.
(iii) යහපත් චරිතයකින් යුක්ත හා මනා ශරීර සෞඛ්‍ය තත්වයෙන් යුක්ත විය යුතුය.
(iv) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් දඩුවම් ලැබුවෙකු නොවිය යුතුය.
(v) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබීම.

04. *වයස* : අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය.

05. *බඳවා ගැනීමේ ක්‍රමය* : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වා වැඩිම ලකුණු ලබාගත් අනුපිළිවෙළ මත බඳවා ගැනීම සිදු කෙරේ.

06. *අයදුම්පත් ඉදිරිපත් කිරීම* :

(I) අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව පිළියෙල කර ගන්නා ලද අයදුම්පත 2018.11.28 වැනි දින හෝ එදිනට පෙර ''ලේකම්, වලල්ලාවිට ප්‍රාදේශීය සභාව, මීගහතැන්න'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

(II) අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ තනතුර සඳහන් කළයුතුය.

(III) අයදුම්පත සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය.

*(අ)* උප්පැන්න සහතිකය
*(ආ)* අධ්‍යාපන සහතික
*(ඇ)* පාසලෙන් අස්වීමේ සහතිකය
*(ඈ)* පදිංචිය සහතික කිරීම සඳහා ග්‍රාම නිලධාරි සහතිකය (ප්‍රාදේශීය ලේකම් සහතික කර තිබිය යුතුය)
*(ඉ)* මෑතකදී ලබාගත් චරිත සහතික 02ක්

මෙම අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුරදී හෝ බඳවා ගැනීම හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල වලල්ලාවිට ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

ඩබ්ලිව්. පාලිත සිසිර කුමාර,
ලේකම්,
වලල්ලාවිට ප්‍රාදේශීය සභාව,
මීගහතැන්න.

2018 නොවැම්බර් මස 05 වැනි දින.

ආදර්ශ අයදුම්පත්‍රය

වලල්ලාවිට ප්‍රාදේශීය සභාව

*වලල්ලාවිට ප්‍රාදේශීය සභාවේ. . . . . . . . . තනතුර සඳහා අයදුම්පත්‍රය*

1. අයදුම්කරුගේ නම මුලකුරු සමග :..........................................................................
2. මුලකුරුවලින් හැඳින්වෙන නම :..........................................................................
3. ස්ථිර ලිපිනය :..........................................................................
4. ග්‍රාම නිලධාරි කොට්ඨාසය :..........................................................................
5. දිස්ත්‍රික්කය :..........................................................................
6. උපන් දිනය : අවුරුද්ද:.......................; මාසය:.......................; දිනය:.......................;
7. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට (2018.11.28) වයස : අවු.:.................මාස:................. දින :.................
8. ස්ත්‍රී පුරුෂ භාවය :........................................
9. විවාහක/අවිවාහක යන වග :........................................
10. ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන්ද ලියාපදිංචි වීමෙන් ද යන වග :........................................
11. ජාතික හැඳුනුම්පත් අංකය :........................................
12. දුරකථන අංකය :........................................
13. අධ්‍යාපන සුදුසුකම් :........................................

මෙම අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු මාගේ දැනීම හා විශ්වාසය පරිදි නිවැරදි බවට ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීමේ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව බඳවා ගැනීමට පෙර හෝ පසුව අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවද දනිමි.

...................................;
අයදුම්කරුගේ අත්සන.

දිනය:.............................